# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2019.01.28 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. උපාධිධාරී භාෂා පරිවර්තක II ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** **(i).** පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/ දෙමළ විෂයයන් සහිතව උපාධියක් ලබා තිබීම.

**සහ**

ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (සා.පෙළ) සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගය හෝ ඊට ඉහළ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත්ව තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** පරික්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන :** **උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හදාරා ඇති උපාධිධාරීන් සහ/හෝ සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ යන භාෂා තුනම සඳහා ප්‍රවීනත්වයක් දක්වන අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

**ඒකාබද්ධ මාසික වැටුප් ක්‍රමය :** UMN 3(II)
රු. 42,885 -18x660 – 54,765/= (මාසික) 2020.01.01 දිනට

**02.** **විනයාරක්ෂක නිලධාරි 11 ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්:** (i). පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම.

**ශාරීරික යෝග්‍යතාව:** පිරිමි - උස : අඩි 5 අගල් 05 ට නො අඩු විය යුතුය.
පපුව : අගල් 32 (සාමාන්‍ය)

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

සටහන : පොලිස් හෝ හමුදා සේවයේ පළපුරුද්දක් ලබා ඇති සහ ක්‍රීඩා කටයුතු,සමාජ සුබසාධන ක්‍රියාකරකම් සම්බන්ධව විශ්වවිද්‍යාල සහ ජාතික මට්මමේ ක්‍රියාකාරි සහභාගිත්වයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

(ii). ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ මේජර් තනතුරට නොඅඩු නිලයක හෝ ශ්‍රී ලංකා පොලීසියේ ඊට සමාන නිලයක පළපුරුද්ද ලබා තිබීම.

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ඒකාබද්ධ මාසික වැටුප් ක්‍රමය :** UMN 3(II)
රු. 42,885 -18x660 – 54,765/= (මාසික) 2020.01.01

- වැටුපට අමතරව රජයේ අනුමත දීමනා, ජීවන වියදම් දිමනාව සහ නිළ ඇඳුම් දීමනා හිමිවේ.

## 03. විගණන සහකාර II ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** **(අ).** විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය විභාගයේ විෂයයන් 04කින් සමත් වීම **හෝ** විෂයයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (උ.පෙළ) නව නිර්දේශය විභාගයේ විෂයයන් 03කින් සමත්වීම.

සහ

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය/ වාණිජ අංක ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සහ

**(ආ).** (i). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (ICASL) ප්‍රාථමික අදියර/ආවසරික I/ පදනම් අදියර සමත් වීම

හෝ

(ii). වරලත් කලමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) පදනම් අදියර සමත් වීම

හෝ

(iii). කොමිෂන් සභාව මඟින් ඉහත (ආ) හි (i) සහ (ii) ට සමාන ලෙස සලකනු ලබන වෙනත් සුදුසුකම්

සහ

**(ඇ).** රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 02 පළපුරුද්ද

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය:** UMN 2(II)
රු. 37,275- 18x495 – 46,185/= (මාසික) 2020.01.01

## 04. කළමනාකරණ සහකාර (පොත් තැබීම්) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්: 01.** i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

ii. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය/ බහු තාක්ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

හෝ

**02.** අ.පො.ස. (සා.පෙළ) විභාගයේ

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගය (වානිජ විෂය ධාරාවෙන්) එක් වරක දී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(a). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

සහ

(b). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය:** UMN 1(III)
රු. 30,725 – 17x300- 35,825/= (මාසික) 2020.01.01

## 05. පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** (I). **(අ.)** අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

සහ

(ආ.) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක කාලයක ප්‍රායෝගික කෘෂිකර්ම පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 31,625 - 7x300-10x355–37,275/= (මාසික) 2020.01.01

## 06.පරිපාලක / නඩත්තු III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :**

i. (අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සහිතව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ සමත්වීම ;

ii. කම්කරු පාලනය පිළිබඳ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : අභියෝගතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMN 1(III)
රු. 30,725 – 17x300- 35,825/= (මාසික) 2020.01.01

**07. හෙද නිලධාරි II ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්: (i).** අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

**(ii).** ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමත හෙද ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 31,625 - 7x300 - 10x355–37,275/= (මාසික) 2020.01.01

**08. මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්: (I).** සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වීම සහ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 31,625 - 7x300 -10x355–37,275/= (මාසික) 2020.01.01

## 09. තාක්ෂණික නිලධාරි (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** (i). අ.පො.ස (උසස් පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් තුනක් එක් වරකදි සමත්ව තිබීම. විෂය සංකළනයන් තීරණය කරනු ලබනුයේ අදාළ පීඨයේ අධ්‍යයනාංශය මඟිනි.

සහ

(ii). තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ N.V.Q. 5 වෙනි මට්ටමට නො අඩු නිපුනතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** ලිඛිත හා/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 31,625 - 7x300-10x355–37,275/= (මාසික) 2020.01.01

## 10. තාක්ෂණික නිලධාරි (රසායනික) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** (i). අ.පො.ස (උසස් පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් තුනක් එක් වරකදි සමත්ව තිබීම.

සහ

(ii). (අ). වෛද්‍ය රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

(ආ). තෘතීක හා අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් හෝ වෙනත් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ රසායන විද්‍යාව/ රසායන ඉංජිනේරුවේදය පිළිබඳ N.V.Q. 5 වෙනි මට්ටමට නො අඩු නිපුනතා සහතිකයක් ලබා තිබීම.

- ඉහත සඳහන් සුදුසුකම් පිළිබඳ තීරණය කරනු ලබනුයේ අදාළ පීඨයේ අවශ්‍යතාවය මතය.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** ලිඛිත හා/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 31,625 - 7x300 -10x355–37,275/= (මාසික) 2020.01.01

## 11. පෙර පාසැල් සහකාර II ශ්‍රේණිය (කොන්ත්‍රාත් පදනම මත)

**අවශ්‍ය සුදුසුකම්:** **(I).** විෂයයන් 06 ක් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම සහ විවෘත විශ්වවිද්‍යාලයේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හෝ මුල්ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ඊට සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය:** UMN 1(III)
රු. 30,725 – 17x300- 35,825/= (මාසික) **2020.01.01**

## 12. වඩු කාර්මික (II ශ්‍රේණිය)

**අවශ්‍යසුදුසුකම්** :

i. කියවීමේ හා ලිවීමේ හැකියාව.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුනත්වයක් ලබා තිබිය යුතු ය.

(අ) ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ තැනීමේ කර්මාන්තය සම්බන්ධ වඩු වැඩ වලදී උපයෝගී කරගනු පිරිමැදුම් පිළිබඳ දැනීම හා ඒවා සකස් කිරීම

පිළිබඳව

(ආ). නොයෙකුත් අන්දමේ වඩු ආයුධ සහ විවිධ දැව වර්ග භාවිතය පිළිබඳ දැනුම හා ඇඳීම් කියවීම පිළිබඳව

(ඇ). අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් නිවැරදිව කියවීම පිළිබඳව

iii. වඩු කර්මාන්තය පිළිබඳව වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි.

iv. අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 45 ට නොවැඩි වියයුතුය.

**සටහන** : හත්වැන්න සමත් අපේක්ෂකයන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**තෝරා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** U – PL 3(III)
රු. 29,915 – 16 x 270 – 34,235/= (මාසික) 2020.01.01

## සේවා කොන්දේසි

- බඳවාගැනීමේ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 8 % කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය විශ්‍රාම වැටුපටද 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.

## අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය

- අයදුම්පත් www.sab.ac.lk විශ්විද්‍යාල වෙබ් අඩවියෙන් හෝ ජ්‍යොෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ අනධ්‍යයන ආයතන අංශය, සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය වෙත 2019 ජනවාරි මස 18 දිනට පෙර සිය ලිපිනය ලියා මුද්දර ගැසූ 9"x4" ලිපි කවරයක් එවීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශය වෙත පැමිණ ලබා ගත හැක.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල ඡායා පිටපත් සමග 2019 ජනවාරි මස 28 දිනට හෝ ඊට පෙර ජ්‍යොෂ්ඨ සහකාර ලේඛකාධිකාරි අනධ්‍යයන ආයතන අංශය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තැ.පෙ. 02 බෙලිහුල්ඔය වෙත එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහල කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතු ය.

- විශ්වවිද්‍යාල සේවයේ /රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

- අවශ්‍ය විස්තර සඳහන් කර නැති හෝ අපැහැදිළි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2019.01.09